## කීස්බරෝ ධම්මසරණ විහාරයේ නව චෛත්‍යයේ කොත නිරාවරණය කළ දා








Photo : **Wijaya Karunasena**

### බෙරික් විහාරස්ථානයේ ඉදිකළ දර්ශණීය වෙසක් තොරණ



ඡායාරූප අශෝක සුබසිංහ

### යුරෝක් දහම් නිකේතනයේ වෙසක් තොරණ

සේයා රූ **දසුන් නිල්මිණි ගජමන්**







# සඳකඩ පහනක කැටයම් ඔපලූ සුනිල් ගෙන්....



**සංවාදය සිසිර දිසානායක**

සුනිල් එදිරිසිංහ. මිනිස් කට හඬෙහි මධුර බවේත් ගැඹුරු බවේත් අපූර්වතම සංකලනයෙන් ගීයට නැවුම් හරයන් මුහු කළ ගේය කැටයම් ශිල්පියෙකුගේ නාමයක්. සඳකඩ පහනක කරටයම් ඔපලමින් රසික සවන් හර බර වදන් වලින් නිම්නාද කර වූ සුනිල් එදිරිසිංහයන් හා සංවාදයක යෙදෙන්නට අප වරම් ලැබුවා. සිය කෙටි ඉසිඹුවක් සන්නස පාඨකයන් වෙනුවෙන් කැප කරන්නට සුනිල් මා හා එකඟ වූයේ ඉතාමත්ම සතුටින්.

**ආධුනිකයකු වශයෙන් ඔබ ඇරඹූ ගායන පුරාවත පිළිබඳ යමක් කිව්වොත්..?**

මා මුලින්ම ගීයක් ගායනා කළේ මගේම සොයුරා අධ්‍යක්ෂණය කළ මාතර ආච්චි චිත්‍රපටයේ. වොලී නානායක්කාර මහත්තයගේ මුල්ම පද රචනාව වීමත් වික්ටර් රත්නායකයන්ගෙ මුල්ම චිත්‍රපට සංගීත අධ්‍යක්ෂණය වීමත් සතිස්චන්ද්‍ර එදිරිසිංහ සොයුරාගේ මුල්ම චිත්‍රපට අධ්‍යක්ෂණය වීමත් නිසා සඳකඩ පහණක ගීය සිව් ක-එළුල් ගීයක් ලෙසත් ඇතැම් අය හඳුන්වනවා.

මෙයින් පස්සෙ වික්ටර් රත්නායකයන් හා මගේ සොයුරාගේ උපදෙස් මත සංගීතය හැදෑරීම ආරම්භ කළ මා 1973 අවුරුද්ද වන විට භාත්කණ්ඩයේ සංගීත විද්‍යා පීඨයේ විශාරද ප්‍රථම විභාගය සම්පූර්ණ කර මුල්ම ගුවන් විදුලි ගීයත් ගායනා කළා. එවකට ශ්‍රී ලංකා ගුවන් විදුලි සේවය ගීතයේ මහ ගෙදර වගෙයි. සමන් චන්ද්‍රනාත් මහත්මයා ගේ පද රචනාවක් වූ ඒ ගීයේ සංගීතය නිර්මාණය කළේ මගේ ඇදුරු තුමා වූ පී වී නන්දසිරි සංගීතවේදියා යි.

ඔය අවුරුදු තුනක කාලය තුළ මට ගයන්නට ලැබුණේ හුලවාලි චිත්‍රපටයට ධර්මසිරි ගමගේ මහත්මයා රචනා කළ කුඩා ගමේ ගීතයත් ශ්‍රී මදාරා චිත්‍රපටය වෙනුවෙන් ප්‍රේමකීර්ති ද අල්විස් මහත්මයා රචනා කළ හිසේ ගිණි ඇවිලෙතේ ගීතයත් පමණයි. මේ ගීත වල සංගීත නිර්මාණය කලේ වික්ටර් රත්නායක මහත්මයයි.

දවසින් දෙකෙන්, සමහර විට එක රැයින්, එක ගීතයකින් ජනප්‍රිය වන්නට සිතන නවකයින්ට මගේ මේ ගමන් ඇරමු අපූරු පාඩමක් කියා දෙනවා කියලයි මට හිතෙන්නෙ. මම කවදාවත් කලබල වුනේ නැහැ. අදටත් එහෙමයි. ඉවසීමෙන් කටයුතු කරලා හොඳම දෙයක් රසිකයන්ට දෙන්නටයි මා අදටත් උත්සාහ කරන්නෙ.

**ක්ෂෙත්‍රයේ රැඳී සිටින්නට නම් නවක ශිල්පියෙකු සතු විය යුතු ගුණාංග පිළිබඳව ඔබ මොනවද හිතන්නෙ..?**

මම අදහන ප්‍රධානම ගුණය තමයි වාසනා ගුණය. සංසාර පුරුද්දෙන් ගායන ප්‍රතිභාව ලබන්නට වාසනාවක් නැතිව බැහැ නේද? ඒ විතරක් නෙවෙයි. තමන්ගේ ගමන දිගටම යන්නට දක්ෂ වගේම යහපත් පිරිවරක් ලබන්නටත් වාසනාව තියෙන්න ඕනෙ. කුමාරදාස සපුතන්ත්‍රී, බන්ඩාර ඇහැලියගොඩ, සුනිල් ආර් ගමගේ, මහාචාර්ය සුනිල් ආරියරත්න, වසන්ත කුමාර කොබවක, රත්න ශ්‍රී විජේසිංහ, ලූෂන් බුලත්සිංහල, බන්දුල නානායක්කාරවසම්, කුලරත්න ආරියවංශ වගේ රචකයන් පිරිසකගේත් රෝහණ වීරසිංහ, එච් එම් ජයවර්ධන, සරත් ද අල්විස් වගේ සංගීත ශිල්පීන් පිරිසකගේත් ආලෝකය ලබන්නට මා වාසනාවන්ත වූවා.

> මම අදහන ප්‍රධානම ගුණය තමයි වාසනා ගුණය. සංසාර පුරුද්දෙන් ගායන ප්‍රතිභාව ලබන්නට වාසනාවක් නැතිව බැහැ නේද? ඒ විතරක් නෙවෙයි. තමන්ගේ ගමන දිගටම යන්නට දක්ෂ වගේම යහපත් පිරිවරක් ලබන්නටත් වාසනාව තියෙන්න ඕනෙ.

උපතින් ලද ප්‍රතිභාව ඔප කරගන්නට ව්‍යුත්පත්තිය අවශ්‍ය යි. ඒ කියන්නේ විෂයය පිළිබඳ කෙරෙන ඉගෙනීම. මලේ මුල් කාලය කැපවුණේ අධයාපනයට. අද්‍යාපනයට අවශ්‍ය ප්‍රධානම දේ තමයි කැපවීම. උනන්දුව. ඒ මත රඳා පවතින සතත අභ්‍යාසය අත්‍යාවශ්‍යමයි. ඒ කියන්නෙ නිරන්තරයෙන් කෙරෙන පුහුණුව.

19 පිටුව